සබරගමු අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Covide-19 සති පාසල් වැඩසටහන

නර්තන විෂය

12 දෙවන වාරය

කාලය-2020.05.04 සිට 2020.05.08

දිනය- 2020.05.08

නිපුණතාවය-06:නර්තන කලාව හා සබැදි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම

නිපුණතා මට්ටම-6.2:දේශීය නර්තන කලාවේ ආරම්භය හා විකාශනය පිළිබඳ ඓතිහාසික තොරතුරු යුග ඇසුරින් විමසුමට ලක් කරයි

පාඩම - ප්‍රාග් බෞද්ධ යුගය

කාර්‍ය පත්‍රිකා 1

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

නිවැරදි පිළිතුර යටින් ඉරක් අදින්න.

1. බුදු දහම.ලංකාවට පැමිණීමට පෙර කාලය ..................... ලෙස හැදින්වේ.

(i)ප්‍රාග් බෞද්ධ යුගය (ii)පශ්චාත් බෞද්ධ යුගය

(iii)ථේරවාදී බෞද්ධ යුගය (iv)සිංහල බෞද්ධ යුගය

2. ශ්‍රී ලංකාවට බුදු දහම ගෙන ඒමෙන් පසුව සිට ක්‍රි.ව.1017 දක්වා කාලය ......................... ලෙස හැදින්වේ.

(i)ප්‍රාග් බෞද්ධ යුගය (ii)පශ්චාත් බෞද්ධ යුගය

(iii)මහායාන බෞද්ධ යුගය (iv)මධ්‍යකාලීන බෞද්ධ යුගය

3. පණ්ඩුකාභය රජු චිත්තරාජ නම් යක්ෂයා සමග සම අසුන් ඉදගෙන දෙව් මිනිස් නාටක නැරඹූ බව ..............සදහන් වේ.

(i)දීපවංශයේ (ii)චූලවංශයේ

(iii)ථූපවංශයේ (iv)මහාවංශයේ

4.විජය කුවේණි දෙදෙනා එක් වූ දින රාත්‍රියේ ............පැවති මංගල උත්සවයකින් සංගීත නාදයක් නිකුත් වූ බව කියවේ.

(i)පුලතිසිපුරයේ (ii)අනුරාධපුරයේ

(iii)සිරිසවත්ථුපුරයේ (iv)මාගම්පුරයේ

5.ශ්‍රී මහා බෝධිය සිරිලංකාවට වැඩමවන අවස්ථාවේ විවිධ නර්තන හා වාදන සහිතව පෙරහැර පැවැත්වූ බව..................... සඳහන් වේ.

(i)මහාවංශයේ (ii)චූලවංශයේ
(iii)ථූපවංශයේ (iv)දීපවංශයේ

6.ශ්‍රී ලංකාවේ නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු විමසීමේදී ඒ සඳහා සුවිශේෂ වූ මූලාශ්‍රයන්.....................යනුවෙන් වර්ගකොට දැක්විය හැකිය.

(i)ජනප්‍රවාද හා පුරාවෘත (ii)ලිඛිත හා පුරාවිද්‍යාත්මක
(iii)සෙල්ලිපි හා වංශකතා (iv)රූකම් හා කැටයම්

7.විජයාවතරණයට පෙර මෙහි විසුවන් යැයි සැලකෙන............. ගෝත්‍රික කණ්ඩායම් අතර දියුණු සංස්කෘතික ලක්ෂණ පැවති බවට සාධක මහාවංශයේ දක්වා ඇත.

(i)යක්ෂ හා නාග (ii)රාක්ෂ හා නාග
(iii)යක්ෂ හා දේව (iv)දේව හා රාක්ෂ

8..................... අවුරුදු පතා බලි දානය කරවූ බව් ඓතිහාසික තොරතුරු වලින් හෙලි වේ.

(i)පඬුවස්දෙව් රජු (ii)විජය රජු
(iii)පණ්ඩුකාභය රජු (iv)දෙවනපෑතිස් රජු

9.මිහිඳු හිමියන් මහාමේඝ වනයට පැමිණි අවස්ථාව කියන ..................... උදය කාලයෙහි මහත් හරසරින් පුරය උතුම් ලෙස සැරසූ බව සඳහන් කරයි.

(i)දීපවංශය (ii)මහාවංශය
(iii)චූලවංශය (iv)ථූප වංශය

10.කාර්තික උත්සවය.................... පිදීමේ උත්සවයක් ලෙස පැවතී ඇත.

(i)කාලවේල (ii)වලවාමුඛී
(iii)පුතින්දර (iv)චිත්තරාජ